චක්‍රලේඛ අංක: 93/03.

මගේ අංකය: 5/ශාප්‍ර/වෙළුම IV.
ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,
අංක 07, ග්‍රෙගරි මාවත,
කොළඹ 07.

1993. ඔක්තෝම්බර් මස 18 වැනි දින.

සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,

රජයේ ඉඩම් ආඥා පනත යටතේ නිකුත් කර ඇති
වාර්ෂික බලපත්‍ර සඳහා ඉඩම් සංවර්ධන බලපත්‍ර
නිකුත් කිරීම

ඇතට රජයේ ඉඩම් ආඥා පනත යටතේ වාර්ෂික බලපත්‍ර දී ඇති ඉඩම් අතුරින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍රයක් නිකුත් කළ හැකි අවස්ථාවන්හිදී එම ඉඩම් සඳහා බලපත්‍ර ලබා දිය යුතු බැව් 1993.10.04. දින පවත්වන ලද ඉඩම් අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ දී තීරණය කරන ලදී. මෙහි දී අදාල ඉඩමට ස්ථිර බලපත්‍රයක් ලබා දීමට සුදුසු වන්නේද යන්න පරීක්ෂා කළ යුතු අතර, රක්ෂිත ඉඩම් සඳහා මෙවැනි බලපත්‍ර දීමට කටයුතු නොකළ යුතුය. එමෙන්ම ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍රයක් නිකුත් කළයුතු වන්නේ ඇතට වාර්ෂික බලපත්‍රධාරීන් එම පනත යටතේ ඉඩම ලබා ගැනීමට සුදුස්සෙක් නම්, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 20/අ වගන්තිය යටතේ අනුමැතිය ඉඩම් කොමසාරිස්/ පළාත් ඉඩම් කොමසාරිස්ගෙන් ලබා ගැනීමෙන් පසුව පමණකි. එසේ නොවන අවස්ථාවලදී මේ ඉඩම් සඳහා දීර්ඝකාලීන බලපත්‍ර ලබා දීමට කටයුතු කළ යුතුවේ.

කරුණාකර මේ සම්බන්ධයෙන් ඔබ විසින් ගනු ලබන ක්‍රියා මාර්ගයේ ප්‍රගතිය 1993.11.10. දිනට පෙර මා වෙත දැනුම් දෙන්නේ නම් කෘතඥ වෙමි.

පී. වී. ප්‍රතිරාජ.
ඉඩම් කොමසාරිස්.

පිටපත:-

ලේකම්, ඉඩම් අමාත්‍යාංශය,
..................... පළාත් සභාව.

1993.10.19.
J.323.

ජය ගෙවිය යුතු ගෙවීම් තීරණය කිරීමට, සංශෝධ ය කිරීමට සහ ගෙවීමට ආණ්ඩු කාරතුමාට ඇති බලය.

**13.** පවරනු ලැබූ කිසියම් පංතියකට අයත් පැවරුම්කරු සම්බන්ධයෙන් සාමාන්‍ය වශයෙන් හෝ කිසියම් විශෙෂ පැවරුම්කර සම්බන්ධයෙන්, විශෙෂ වශයෙන් හෝ මිළ, කුලිය, රජයේ කොටස හෝ වෙනත් ආකාරයකින් රජයට ගෙවිය යුතු හෝ රජය මගින් අයකර ගත යුතු මුදල් තීරණය කරන්නට අග්‍රාණ්ඩුකාරතුමාට පිළිවන. එසේ ම එබඳු කිසියම් පැවරීමක් පිළිබඳ නීත්‍යානුකූල ලේඛනයක සඳහන් වී ඇති ප්‍රතිඥා හා කොන්දේසි වලට යටත්ව එබඳු කිසියම් ගෙවීමක් ගෙවන්නට, වෙනස් කරන්නට හෝ නො ගෙන හරින්නට අග්‍රාණ්ඩුකාරතුමාට පිළිවන.

ඥ ආදියේ කොන්දේසි ආදිය ලිහිල් කරන්නට අග්‍රාණ්ඩුකාර තුමාට ඇති බලය.

**14.** මෙම ආඥාපනත යටතේ නිකුත් කරන ලද කිසියම් බද්දක, අවසර පත්‍රයක, හෝ බල පත්‍රයක විස්තර වී ඇති නියම, ප්‍රතිඥා හා කොන්දේසි අතුරෙන් කුමක් වුව ද, කවර වේලාවක වුව ද, ලිහිල් කරන්නට හෝ අවලංගු කරන්නට අග්‍රාණ්ඩුකාර තුමාට පිළිවන. එසේම කවර විටක වුව ද, ලැබුම්කරු සමග එකඟ වීමෙන් එබඳු නියම, ප්‍රතිඥා හෝ කොන්දේසි වෙනස් කරන්ට හෝ සංශෝධනය කරන්ට ද පිළිවන.

ප්‍රතිඥා අනුව ක්‍රියා කිරීමේ කාලය දීර්ඝ කිරීමට අග්‍රාණ්ඩුකාර තුමාට ඇති බලය.

**15.** මීට ප්‍රතිවිරුඬව පැවරීමේ නීත්‍යානුකූල ලේඛනයේ විධිවිධාන යෙදී නැති කල්හි, එහි සඳහන් වී ඇති කිසියම් කාය්‍යයක්, කොන්දේසියක් හෝ ප්‍රතිඥාවක්, ඉටු කිරීමට ඉඩම ලැබූ තැනැත්තාට දී ඇති කාලය, තමාට සුදුසු යයි වැටහෙන කාලසීමාවක් දක්වා තමාට සුදුසු යයි හැඟෙන කොන්දේසිවලට යටත්ව දීර්ඝ කරන්නට අග්‍රාණ්ඩුකාර තුමාට පිළිවන. තවද එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාවක්, පනවන ලද නියමයක්, නීත්‍යානුකූල ලේඛනයට ඇතුළත් කළ හැටියට සැළකිය යුතු අතර, මුල් ප්‍රතිඥාවක් හෝ කොන්දේසියක් ලෙසින් ම ඒවා බල පවත්වනු ලබන්නේය, වලංගු ද වන්නේ ය.

අවසර පත්‍ර හා බලපත්‍ර, ප්‍රදානය ලබන්නන්ට පුද්ගලික විය හැකි බව.

**16.** (1) කිසියම් අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් එය ලැබූ තැනැත්තා විෂයෙහි පෞද්ගලික යයි එම අවසර පත්‍රයේ හෝ බල පත්‍රයේ විධිවිධාන යෙදී ඇති කල්හි, එබඳු අවසර පත්‍රයක් හෝ බල පත්‍රයක් යටතේ ඇත්තා වූ සියලු ම අයිතිවාසිකම් එය ලැබූ පුද්ගලයාගේ මරණයෙන් අවසාන වශයෙන් නිම වන්නේ ය.

(2) කිසිම අවසර පත්‍රයක් හෝ බල පත්‍රයක් එය ලැබූ තැනැත්තා විෂයෙහි පෞද්ගලික යයි එම අවසර පත්‍රයේ හෝ බලපත්‍රයේ විධි විධාන යෙදී ඇති කල්හි, එම අවසර පත්‍රය හෝ බලපත්‍රය යම් ඉඩමක් සඳහා නිකුත් කරන ලද්දේ ද, එම ඉඩම හා එහි කර ඇති සියලු ම දියුණු කිරීම්, එම ප්‍රදානය ලැබූ පුද්ගලයාගේ මරණින් පසු රාජ සන්තක දේපල බවට පත් වන්නේ ය. එසේ ම එම ප්‍රදානය ලැබූ තැනැත්තාගේ මාර්ගයෙන්, ඔහුගෙන් හෝ ඔහු යටතේ අයිතිවාසිකම් කියන කවරෙකුට වුව ද, එබඳු ඉඩමේ කිසිම අයිතියක් නැති වන අතර, එහි කරන ලද කිසියම් දියුණු කිරීමක් සඳහා කිසියම් වන්දියක් අය කර ගැනීමට එබඳු කිසිවෙකුට අයිතිවාසිකමක් නැත්තේ ය.

බලපත්‍ර හෝ අවසර පත්‍ර අවලංගු කිරීම.

**17.** (1) කිසියම් අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් ලැබූ තැනැත්තෙකු එම අවසර පත්‍රයේ හෝ බලපත්‍රයේ සඳහන් කිසියම් කොන්දේසියක් අනුව කටයුතු නො කරන ... ආණ්ඩුවේ දිසාපති තැනට ඒත්තු ගිය අවස්ථාවක දී, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 10... සිට සහ 128 දක්වා වගන්තිවල නියමිත ක්‍රියා පරිපාටිය අනුව එම අවසර පත්‍රය ... බලපත්‍රය අවලංගු කර එම පුද්ගලයා එම ඉඩමෙන් ඉවත් කරවීමට ඔහුට පිළිවන. ... එසේ කිරීමේ දී මෙම ආඥාපනත යටතේ අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් දරන්නෙ... පූර්වෝක්ත ආඥාපනත යටතේ අවසර පත්‍ර දරන්නෙකු හැටියටත්, මෙම ආඥාපන... යටතේ අවසර පත්‍රයකට හෝ බලපත්‍රයකට විෂය වී ඇති ඉඩම් එම ආඥා පනත යට... නිකුත් කරන ලද අවසර පත්‍රයකින් අන්සතු කරන ලද ඉඩමක් හැටියටත්, සළකා ... ආඥා පනතේ පූර්වෝක්ත විධිවිධාන යථා යෝග්‍ය පරිදි අදාළ වන්නේය.